053969
2016/06/28
ML/PR

# ශ්‍රී ලාංකේය විකල්ප නාට්‍ය කලාවේ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක්

(සිංහල නාට්‍ය පිළිබඳ විශේෂ අවධානයකින්)

එස්.එම්.එම්. සේනානායක

කැළණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි සිංහල පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයයි.

2010 - ජූනි

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
පුස්තකාලය

# සාර සංග්‍රහය

බටහිර යුරෝපය ඇතුළු රටවල් රාශියක ව්‍යාප්ත වූ විකල්ප නාට්‍ය ප්‍රවණතා එක්දහස් නවසිය හැටෙන් ඇරඹි දශකයේ සිට වත්මනය දක්වා ශ්‍රී ලාංකේය නාට්‍ය ශිල්පීන්ගේ නිර්මාණ කෙරෙහි විවිධාකාරයෙන් බලපා ඇති බව පැහැදිලි වේ. එක්දහස් නවසිය හැත්තෑවෙන් ඇරඹි දශකයේ දී ගාමිණී හත්තෙට්ටුවේගම ඇතුළු නාට්‍ය කණ්ඩායම බටහිර Street Drama රංග ක්‍රමය ආදර්ශයට ගෙන නිර්මාණය කරන ලද වීදි නාට්‍ය නම් වූ විකල්ප කලාව දේශීය මුහුණුවරක් සහිත ව පුළුල් අර්ථයකින් භාවිතයට ගැනීමට ප්‍රයත්න දැරූහ. ඉන් පසු දශකයේ දී නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වන ව්‍යවහාරික රංග කලාව (Applied Theatre) සංවාද මණ්ඩප නාට්‍ය (Forum Theatre) ජංගම රඟමඩල (Mobile Theatre) දුගී රංගය (Poor Theatre) ප්‍රජා නාට්‍ය (Social Theatre) යන විකල්ප නාට්‍ය ක්‍රම ආශ්‍රයෙන් නිර්මාණාත්මක අත්හදාබැලීම් කිරීමටත් විවිධ අරමුණු සඳහා එම නිර්මාණ භාවිතයට ගැනීමටත් මෙරට ඇතැම් නාට්‍ය කණ්ඩායම් ප්‍රයත්න දැරූහ.

ශ්‍රී ලාංකේය නාට්‍ය කලා ඉතිහාසයේ විවිධ යුගවල බිහි වූ විකල්ප ප්‍රවණතා පිළිබඳ විමර්ශනය කිරීමේ දී උඩරට හා පහතරට යක්කම්, පෙළපාළි, සන්නි, සොකරි, කෝලම් මෙන් ම නාඩගම්, කවි නාඩගම්, නෘත්‍ය නාටක, පාස්කු, සිංහල හා දෙමළ ජනයාගේ ආගමික උත්සව ආශ්‍රිත රංග භාවිතයෙහි සුවිශේෂතා රාශියක් වේ. එමෙන් ම දේශිය පැරණි රංග ආකෘතීන් හා වෙනත් නාට්‍ය සම්ප්‍රදායන් ආදර්ශයට ගෙන නව නාට්‍ය සම්ප්‍රදායක් බිහි කිරීමට ඇතැම් ශ්‍රී ලාංකේය නාට්‍ය ශිල්පීන් සමත් වුව ද එම නාට්‍ය කලාව ද ප්‍රොසීනියම් ආකෘතියට ම සීමා විය.

දේශිය රංගයට සමාන විවෘත ආකෘතියක් භාවිතයනට ගත් ශ්‍රී ලාංකේය වීදි නාට්‍ය ශාන්තිකර්ම හා කෝලම්, සොකරි වැනි නාටකවලින් ආදර්ශ ලබාගෙන නිර්මාණය වී ඇත. විවිධ දුෂ්කරතා මධ්‍යයේ සාමාන්‍ය ජනයා වෙත රැගෙන යමින් සමාජ මෙහෙවරක නිරත ව සිටින ඇතැම් වීදි නාට්‍ය කණ්ඩායම් මෙම කලාව පවත්වාගෙන යාම සඳහා ප්‍රයත්නයක යෙදෙති. එහෙත් විද්වතුන්ගේ සහ පර්යේෂකයින්ගේ නිසි අවධානයක් මේ කෙරෙහි යොමු නොවූ හෙයින් අනූව දශකයේ සිට මෙම විකල්ප නාට්‍ය කලාව කිසියම් පරිහානියකට පත් ව ඇත.

ජන කරළිය, ජන රංග සභාව, Inter Act Art සංවිධානය, GET Peoples Platform, සුනෙර පදනම සහ තිදොර යන අද්‍යතන විකල්ප නාට්‍ය කණ්ඩායම් විවිධ අත්හදාබැලීම් කරමින් රංගකලාව ප්‍රජාවගේ යහපත සඳහා භාවිතයට ගැනීමට කිසියම් ප්‍රයත්නයක නිරත ව සිටිති. මෙම කණ්ඩායම් අතරින් සංවාද මණ්ඩප නාට්‍යාකෘතිය (Forum Theatre) ආදර්ශයට ගත් නාට්‍ය

කණ්ඩායම් ඔවුන්ගේ රංගය සඳහා භාවිතයට ගෙන ඇති ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය ඈත අතීතයේ ශ්‍රී ලාංකේය ජන සමාජයේ ක්‍රියාත්මක වූ වරිග සභා වැනි ආකෘති සමග සමානත්වයක් ගනියි. සමාජ ගැටලුවලට මැදිහත් වීම, යහපත් මානව සබඳතා ගොඩනැගීම ආදී සමාජ මෙහෙවර රාශියක් පූර්වෝක්ත රංග ක්‍රම භාවිතයෙන් සිදු වේ.

වීදි නාට්‍ය සහ අද්‍යතන විකල්ප නාට්‍යවල ක්‍රියාකාරීත්වය සම්මත වේදිකා නාට්‍ය ප්‍රේක්ෂක රසවින්දනය, විචාර කලාව, නාට්‍ය ඇගයීම් ක්‍රියාවලිය, නාට්‍ය අධ්‍යාපනය කෙරෙහි ද බලපෑමක් ඇති කිරීමට සමත් ව ඇත.

අද්‍යතන විකල්ප නාට්‍ය මගින් හඳුන්වා දෙනු ලබන රංගය විභේදනය කිරීම, ප්‍රේක්ෂක නළුවා (Spect - Actor) යන සංකල්ප දේශීය ශාන්තිකර්මවල රංගයෙහි ද භාවිතයට ගෙන ඇති අතර රටයකුම, කපුයක්කාරිය, දොළහ පෙළපාලිය ආදියෙහි භාවිත ඇතැම් රංග ක්‍රම මෙම නූතන භාවිතයන් අතික්‍රමණය කර ඇති ආකාරය මෙහි දී පැහැදිලි කෙරේ.